# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/23 - 2016 මැයි මස 11 වැනි බදාදා - 2016.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1837/8 හා 2013.11.19 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 6.2.3.1.1, 6.2.4.1 හා 6.2.4.2 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2016 මැයි මස 11 වැනි දින,
කොළඹ 10,
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දී ය.

### සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව

**6.2.3.1.1 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජෛවීය විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන් අතුරින් විෂයන් 03 ක් හදාරා සියළුම විෂයන්ගෙන් එකවර සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයන් අතුරින් විෂයන් 03 ක් හදාරා සියළුම විෂයන්ගෙන් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

සහ

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් 04 ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.


1A - G 23411 — 57 (2016/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**6.2.4.1 එක් වර්ෂයක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම**

මෙහිදී දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයේ ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

එලෙස එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගතයුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන් ද 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය සහිත අයදුම්කරුවන් අතරින් පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

**6.2.4.2 වර්ෂ දෙකක් (02) හෝ ඊට වැඩි වර්ෂ ගණනක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම**

මෙහිදී දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම් කර සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යාව විෂය ධාරාව හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළව එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගතයුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන්ද 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

05 - 747

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.